# පුරප්පාඩු

## දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

### මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

හරිත දේශගුණ අරමුදලේ ප්‍රධානයක් (Grant of Green Climate Fund) මත ක්‍රියාත්මක වන දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ **(PMU)** පවත්නා පුරප්පාඩු සඳහා **කොන්ත්‍රාත් පදනම මත** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1/2016 ට අනුව සුදුසුකම් හා පලපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මී ඔය, මල්වතු ඔය සහ යාන් ඔය ගංගා ද්‍රෝණි ආශ්‍රිත දිස්ත්‍රික්කයන් තුල ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘති 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ.

අයදුම්කරුවන් වයස අවුරුදු 63 ට අඩුවිය යුතුයි. ඉංග්‍රීසි භාෂා කුසලතාව, රජයේ නීති රෙගුලාසි පිළිබඳ දැනුම සහ පරිඝණක සාක්ෂරතාව පූර්ව අවශ්‍යතාවයන් ලෙස සැලකේ. මීට අතිරේකව ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳව වසර 3ක රැකියා පලපුරුද්දක් තිබිය යුතුවේ.

**1. ජ්‍යෙෂ්ඨ සිවිල් ඉංජිනේරු / Senior Project Engineer -තනතුරු 3**
**(කොළඹ - 01, ක්ෂේත්‍රගත - 02)**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ උපාධියක් තිබීම **හෝ** පිළිගත් වෘත්තීමය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීමය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම **සහ** අදාළ සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 4ක් ඇතුලත්ව කළමනාකරණ මට්ටමේ වසර 8ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්ද ඇතුළුව අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම **හෝ** අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් උපාධියක්ද ඇතුළුව පිළිගත් වෘත්තීමය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීමය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම **සහ** අදාළ සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ අවුරුදු 6ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

රාජ්‍ය දීප ව්‍යාප්ත සේවයේ පළමුවෙනි (I)ශ්‍රේණියේ නිලධාරියෙකු වීම **සහ** පළමුවෙනි (I)ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ වසර 5ක පලපුරුද්දක් ලබා තිබීම

**වැටුප් පරිමාණය - PS3- රු.125,000.00 – 140,000.00 ***

**4. ප්‍රසම්පාදන විශේෂඥ / Procurement Specialist -තනතුරු 1**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ උපාධියක් තිබීම **හෝ** පිළිගත් වෘත්තීමය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීමය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම **සහ** අදාළ සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 6ක සේවා පලපුරුද්දක් ලබා තිබිය යුතුයි.

හෝ

රාජ්‍ය දීප ව්‍යාප්ත සේවයේ දෙවන/ තෙවන II/III ශ්‍රේණියේ නිලධාරියෙකු වීම සහ දෙවන/ තෙවන (II/III) ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ වසර 5ක පලපුරුද්දක් ලබා තිබීම

**වැටුප් පරිමාණය - PS4- රු.100,000.00 – 115,000.00 ***

* කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2016 ට අනුව ඉහත සඳහන් කර ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**අයදුම්පත්**

අයදුම්කරුවන් විසින් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකතන අංකයන්ද ඇතුලත්ව තම අධ්‍යාපන, වෘත්තීමය සුදුසුකම් සහ සේවා පලපුරුද්ද සඳහන් කරමින් සිය ජීව දත්ත පත්‍රිකාව යොමු කළ යුතුය.

සුදුසුකම් හා සේවා පලපුරුද්ද පදනම් කර ගනිමින් තෝරා ගනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් සිදු කරන අතර අයදුම්කරුවන්ගේ කුසලතාවන්ගේ ප්‍රමුඛතාවය මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

**මුලික සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා අදාළ සහතික වල ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු අතර සියළුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුයි.

**එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන් වෙන් කවරයන්හි බහා 2017 සැප්තැම්බර් 11 දින හෝ ඊට පෙර** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ **වම්පස ඉහළ කෙළවර අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.**

වැඩිදුර විස්තර **environmentmin.gov.lk** මගින් ලබා ගත හැක.

ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
මානව සම්පත් සංවර්ධන අංශය
සම්පත්පාය
අංක 82, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

2017 අගෝස්තු 27